පුරප්පාඩු

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2026.11.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

වැඩ සහායක III ශ්‍රේණිය

1	**අවශ්‍ය සුදුසුකම්:**	අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතුය.	
2	**වයස:**	අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.	
3	**වෙනත්:**	අ)	ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
		ආ)	තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.
		ඇ)	යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
3	**වැටුප් පරිමාණය:**	රු. 42,775-16×450 – 49,975 (මාසික) U-PL 1(III) *	
4	**බඳවා ගැනීම:**	වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්	

* ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

සේවා කොන්දේසි

1. මෙය ස්ථිර තනතුරකි. පත්වීම් වසර තුනක (03) පරිවාස කාලයක් සඳහා යටත්වය.
2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරයි නම් ඔහුගේ/ඇයගේ අදාළ පත්වීම් අධිකාරිය හරහා තම නිදහස් කිරීම ලබා ගත යුතුය.
3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම්පවත්වා ගැනීමට අයිතියක් නොමැත.

1. **අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**
   අයදුම්පත් https://pgie.ou.ac.lk "vacancies" යන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත, සත්‍ය පිටපත් බවට සනාථ කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වලට අදාල සහතික පිටපත් සමග **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල නුගේගොඩ.** යන ලිපිනයට 2026 නොවැම්බර් 25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
3. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සනාථ කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ ඉහත පරිදි අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

අධ්‍යක්ෂ
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ.
2026.11.10

අයදුම්කරුවන් **අයදුම්පතට අමතරව** https://forms.gle/k5G2j4ntcJyVTKPFA වෙබ් සබැඳියට පිවිස තොරතුරු ද ඇතුළත් කරන්න.